**ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය - 2021**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදල අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 16 හි 51 ඡේදය ප්‍රකාරව ජංගම නොවන වත්කම්වල ඵලදායී ජීවිත කාලය සමාලෝචනය නොකිරීම හේතුවෙන් සම්පූර්ණයෙන්ම ක්ෂය කර ඇතිමුත් තවදුරටත් භාවිතා කරමින් පවතින රු.696,175 ක පිරිවැය වූ ලී බඩු සහ සවි කිරීම් , කාර්යාල උපකරණ සහ පරිගණක වැනි වත්කම්වල ඵලදායී ජීවිත කාලය පිළිබඳ වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 08 ප්‍රකාරව ප්‍රතිශෝධනය කර නිවැරදි ධාරණ අගය ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | ලීබඩු හා සවිකිරීම්, පරිගණක උපාංග හා කාර්යාල උපකරණ ආදිය භාවිතා කළ ද අගයකර ඵලදායී ජීවිත කාලය තක්සේරු කළ නොහැක .ඉවත් කළ යුතු තත්ත්වයේ පවතින පරිගණක වැනි උපකරණ යාවත්කාලීන කළ නොහැකි තත්ත්වයේ සහ පූර්ණ කාර්යක්ෂමතාවයෙන් භාවිතා කළ නොහැකි තත්ත්වයේ පවතින බැවින් ඉදිරියේදී ඉවත් කිරීමට කටයුතු කරනු ලැබේ. | සම්පූර්ණයෙන්ම ක්ෂය කරන ලද වත්කම් ප්‍රත්‍යාගණනය කළ යුතුය. |
| (ආ) 2021 දෙසැම්බර් 31 දිනට සක්‍රීය දායකයන් හා ධීවර විශ්‍රාමිකයන්ගේ විශ්‍රාම වැටුප් වගකීම රු.4,644,164,591 ක් විය. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 37 හි 59 වන ඡේදය ප්‍රකාරව සක්‍රීය දායකයන් හා ධීවර විශ්‍රාමිකයන්ගේ විශ්‍රාම වැටුප් වගකීම සඳහා ආයුගණක තක්සේරුව කාලානුරූපීව සිදු කළ යුතු වුවද 2007 වර්ෂයෙන් පසුව විශ්‍රාම වැටුප් වගකීම ආයුගණක තක්සේරුව මඟින් ගණනය කර නොතිබුණි. | 2007 වර්ෂයේ ආයුගණක තක්සේරුව මත පදනම්ව වගකීම ගණනය කර ඇති අතර මණ්ඩලයේ සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රම ප්‍රතිව්‍යූහ ගත කළ පසු ආයුගණක තක්සේරුව සිදු කිරීමට කටයුතු කරනු ලැබේ. | විශ්‍රාම වැටුප් වගකීම ආයුගණක තක්සේරුව අනුව කාලානුරූපීව ගණනය කළ යුතුය. |

## 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 07 හි 43 ඡේදය ප්‍රකාරව මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පිළියෙල කිරීමේදී මුදල් හෝ මුදල් හා සමාන දෑ යොදාගැනීම අවශ්‍ය නොවන ආයෝජන හා මූල්‍ය ගනුදෙනු මුදල් ප්‍රවාහ ප්‍රකාශයකින් ඉවත් කළ යුතු වුවත් ධීවර විශ්‍රාමිකයින් සඳහා වූ මරණ පාරිතෝෂික අරමුදලට වෙන්කරන ලද රු.1,752,840 ක දායකය සදොස් ලෙස ආයෝජන මුදල් ප්‍රවාහය යටතේ දක්වා තිබුණි. | ධීවරයන්ගේ මරණ පාරිතෝෂික අරමුදලට වෙන් කරන ලද ප්‍රමාණය මුදලින් ගෙවා නොමැති නිසා වෙන් කිරීම මෙහෙයුම් කටයුතු යටතේ දැක්වීමට 2022 වර්ෂයේ සිට කටයුතු කරනු ලැබේ. | මුදල් හෝ මුදල් සමාන දෑ යොදාගැනීම අවශ්‍ය නොවන ආයෝජන හා ගනුදෙනු මුදල් ප්‍රවාහ ප්‍රකාශයකින් ඉවත් කළ යුතුය. |
| (ආ) ධීවර විශ්‍රාම වැටුප් අංශයෙහි කිසිදු ඍජු රාජකාරියක් ඉටු නොකරන නිලධාරීන් තිදෙනෙකුගේ සමාලෝචිත වර්ෂයේ සම්පූර්ණ වැටුප් එකතුව රු.1,979,712 යෝජනා ක්‍රමයේ වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි. | මෙම නිලධාරීන් බඳවාගෙන ඇත්තේ මෙම යෝජනා ක්‍රමයේ රාජකාරී ඉටු කිරීමට වන අතර වර්තමානයේ වෙනත් රාජකාරි කටයුතු සිදු කරනු ලබයි .යෝජනා ක්‍රමයට අයත් රාජකාරි චක්‍රාකාරයෙන් වෙනත් නිලධාරීන්ද සිදු කරනු ලබන නිසා මෙම නිලධාරීන්ගේ වැටුප යෝජනා ක්‍රමයට ඇතුළත් කර ඇත. ප්‍රමාණවත් සේවක සංඛ්‍යාවක් බඳවා ගැනීමෙන් පසු යෝජනා ක්‍රමයට අදාළ සේවකයින්ගේ වැටුප් යෝජනා ක්‍රමයට අන්තර්ග්‍රහණය කිරීමට නියමිතය. | යෝජනා ක්‍රමයට අදාළ වියදම් පමණක් ගිණුම්ගත කළ යුතුය. |
| (ඇ) ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ දිස්ත්‍රික් ධීවර කාර්යාලවල දිස්ත්‍රික් ධීවර ව්‍යාපෘති නිලධාරීන් විසින් ධීවර විශ්‍රාම වැටුප් දායක මුදල් අයකිරීමේදී එක් වාරිකයකින් රු.11 බැගින් අයකරනු ලබන කොමිස් මුදල මෙම යෝජනා ක්‍රමයේ වියදමක් ලෙස හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණු අතර එම කොමිස් මුදල ධීවර විශ්‍රාම වැටුප් දායක මුදලින් ද අඩුකර ගිණුම්ගත කර තිබුණි. | දිස්ත්‍රික් ධීවර කාර්යාල මගින් එවන ලද මුදල් වාරික යටතේ ගිණුම් ගත කර ඇති අතර ඉදිරියේදී කොමිස් මුදල ද ගිණුම්ගත කිරීමට කටයුතු කරනු ලැබේ. | සම්පූර්ණ ආදායම සහ වියදම හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |

## 1.5.3 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විෂයය | මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම | අනුරූපී වාර්තා අනුව වටිනාකම | වෙනස | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | | |
| ධීවර රක්ෂිතයින් 121 දෙනෙකුගෙන් ලද දායක මුදල | 146,707 | 117,648 | 29,059 | මණ්ඩලය වෙත ලද සියලු චෙක්පත් ආදායම ලෙස හඳුනාගෙන ඇති අතර සැසඳුම් නොකළ ලැබීම් | සැසඳීම් සිදු කර වෙනස හඳුනාගත යුතුය. |

| | | |
|---|---|---|
| | කඩිනමින් සැසඳුම් කරනු ලැබේ. | |

### 1.5.4 අරමුදලේ අඛණ්ඩ පැවැත්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| යෝජනා ක්‍රමයේ විශ්‍රාම වැටුප් වගකීම සමාලෝචිත වර්ෂය අවසානයට රු.4,644,164,591 ක් වූ අතර එය ඉකුත් වර්ෂයට වඩා සියයට 9 ක වැඩි වීමකි. එසේම සමුච්චිත අරමුදලෙහි ශුද්ධ වත්කම් තත්ත්වය සෘණ රු.4,103,708,674 ක් දක්වා එනම් ඉකුත් වර්ෂයට වඩා සියයට 12 ක වැඩි වී තිබීමෙන් එයද යෝජනා ක්‍රමයේ අඛණ්ඩ පැවැත්ම කෙරෙහි අහිතකර ලෙස බලපා තිබුණි. | මෙම යෝජනා ක්‍රමය ස්වයං මූල්‍ය පදනමකින් ක්‍රියාත්මක නොවන නිසා මෙම තත්ත්වය උද්ගත වී ඇත .ඒ අනුව වාර්ෂිකව ගෙවිය යුතු විශ්‍රාම වැටුප් වගකීම ඉහළ යනු ලබන අතර එම නිසා ශුද්ධ වත්කම් අගයද අඩු වේ .එම හේතු නිසා මෙම යෝජනා ක්‍රමය සඳහා නව බඳවා ගැනීම් සිදු කිරීම ප්‍රවර්ධනය නොකරයි. | යෝජනා ක්‍රමය සක්‍රීය කර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2010 වර්ෂයේ සිට ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමයෙන් ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමයට අවස්ථා කිහිපයකදී එම යෝජනා ක්‍රමයේ කටයුතු සඳහා රු.518,000,000 ක් වූ ණය මුදල් ලබාදී තිබුණු අතර 2021 වර්ෂය අවසානයට එයින් අය විය යුතු ණය හා පොලී මුදල් එකතුව රු.248,129,566 ක් තවදුරටත් ඉදිරියට ගෙන එමින් පැවතුණි. | විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය තුළ ඇතිවූ මූල්‍ය අර්බුදය පිළිබඳව මහා භාණ්ඩාගාරයේ පැවති සාකච්ඡාවේදී තීරණයවූ පරිදි ප්‍රතිපූර්ණය කිරීමේ පදනම මත මෙම මුදල් ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය වෙත ලබා දී ඇත .මේ වන විට රුපියල් මිලියන 248.1 ක මුදලක් ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය වෙතින් අයවීමට ඇති අතර, ණය මුදල හා ඒ මත පොළිය ඉහත ශේෂය තුළ ඇතුළත්ය. මෙම මුදල ක්‍රමිකව අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ. | ණය සහ පොලිය, අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) 1990 අංක 23 දරන ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රම පනත | | | |

| | | | | |
|---|---|---|---|---|
| (i) | 5 සහ 6 වගන්ති | නියමිත සුදුසුකම් දරන්නාවූ ද වයස අවු 18 ට නොඅඩු සහ වයස අවුරුදු 59 ට නොවැඩි ධීවරයන්හට තම වෘත්තීය කටයුතු කරගෙන යාමට නොහැකි ස්ථිර අර්ධ දුබලතාවයක් හෝ පූර්ණ දුබලතාවයක් වූ විට ආර්ථික වශයෙන් යම් පිටුවහලක් වීමට දීමනාවක් ගෙවීම, මරණයකදී මරණ පාරිතෝෂිකයක් ගෙවීම හා වයස අවුරුදු 60 සම්පූර්ණ වූ විට කාලපරිච්ඡේද අනුව විශ්‍රාම වැටුපක් ගෙවීම අරමුණු කරගෙන මෙම යෝජනා ක්‍රමය ආරම්භ කර තිබුණු නමුත් 2018 වර්ෂයෙන් පසු යෝජනා ක්‍රමයට කිසිදු සාමාජිකයෙකු බඳවාගෙන නොතිබුණි. | ඉදිරියේදී මූල්‍යමය වශයෙන් ශක්‍යතාවයකින් යුතු ධීවර විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයක් හඳුන්වාදීමට අපේක්ෂිත බැවින් එම යෝජනා ක්‍රමය සඳහා බඳවා ගැනීම් ප්‍රවර්ධනයට අවශ්‍ය කටයුතු සිදුකිරීමට අපේක්ෂිතය. | යෝජනා ක්‍රමය සක්‍රීය කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ii) | 7 වන වගන්තිය | දායකයෙකුට වයස අවුරුදු 60 සම්පූර්ණ වූ දින සිට විශ්‍රාම වැටුප් සඳහා හිමිකම් ලබන නමුත් යෝජනා ක්‍රමය විසින් විශ්‍රාම වැටුප් සකස් කළ දින සිට ගෙවීම් කර තිබූ අතර හිඟ විශ්‍රාම වැටුප් මුදල් ගෙවා නොතිබුණි. එම නිසා 2009 ජනවාරි සිට 2021 දෙසැම්බර් දක්වා කාලයට අදාළව විශ්‍රාම වැටුප් ඉල්ලුම් කළ ධීවරයන් 178 ක් සඳහා ප්‍රතිපාදිත හිඟ විශ්‍රාම වැටුප් රු.4,863,160 ක් ගෙවීමට කටයුතු කර නොතිබුණි. | ධීවර විශ්‍රාම වැටුප් ලබාගැනීම සඳහා අයදුම්පත් ඉදිරිපත් කිරීමට දිගුකාලයක් පමාවී ඇති ධීවරයින්හට හිඟ විශ්‍රාම වැටුප් ගෙවීමේදී ප්‍රමාද වීමට හේතු වූ කාරණා සොයා බැලීමෙන් පසු ගෙවීම් කිරීමේදී පැරණි හිඟ විශ්‍රාම වැටුප් ගෙවීම තාවකාලිකව අත්හිටුවීම නිසා මෙම තත්ත්වය උදාවී ඇත. එසේ ප්‍රමාද වීමට හේතු කාරණා ග්‍රාම නිළධාරී හා ප්‍රාදේශීය ලේකම් ඇතුළු දිස්ත්‍රික්කයෙහි රාජ්‍ය නිළධාරීන්ගෙන් තහවුරු ලබාගැනීමෙන් පසු අදාළ මුදල් ගෙවීමට කටයුතු කරනු ලැබේ. | විශ්‍රාම වැටුප් සඳහා හිමිකම් ලබන දින සිට ගෙවීම් කළ යුතුය. |
| (iii) | 16 වන වගන්තිය | දායකයෙකු දායක මුදල් ගෙවීමේදී අනුගාමී වාරික දහයක් සඳහා වාරික මුදල් නිසිපරිදි නොගෙවීම මත ප්‍රතිලාභ අහිමි වී ඇති අවස්ථාවක ඒ බව දායකයා වෙත දැනුවත් කිරීම් කළ යුතුයි. එසේ වුවද එම දැන්වීම නොකිරීම හේතුවෙන් වයස අවුරුදු 60 සම්පූර්ණ වූ විශ්‍රාම වැටුප් ලැබීමේ හිමිකම ඇති බව අදහස් කරමින් 2020 වර්ෂයේදී පුද්ගලයින් 58 දෙනෙකු සහ 2021 වර්ෂයේදී පුද්ගලයින් 42 දෙනෙකු අයදුම්පත් | දායකයා දායකත්වය අවලංගු වූ අයෙක්ද යන වග සොයා බලා වාරික මුදල් අයකර ගැනීම සම්බන්ධයෙන් අවශ්‍ය උපදෙස් අඛණ්ඩව ඔවුන් වෙත ලබාදීමට මණ්ඩලය විසින් කටයුතු කරනු ලබයි. කෙසේ වුවද, යම් අවස්ථාවක එසේ දායකත්වය අහෝසි වූ දායකයෙකු තවදුරටත් දායක මුදල් ගෙවා ඇත්නම් ,ඔහුට වයස අවුරුදු 60 සම්පූර්ණ වීමේදී අදාළ ශුද්ධ වාරික මුදල හා පොළිය ගෙවීමට කටයුතු කරනු ඇත.<br>ධීවර විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට සම්බන්ධ නිසි බලධාරියා වන ධීවර දෙපාර්තමේන්තුව වෙත විගණන විමසුමේ | අනුගාමී වාරික දහයක් සඳහා වාරික මුදල් නිසි පරිදි නොගෙවීම මත ප්‍රතිලාභ අහිමි වී ඇති අවස්ථාවක ඒ බව දායකයා වෙත දැනුවත් කිරීම් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ඉදිරිපත් කර තිබුණද වාරික මුදල් නිසිපරිදි නොගෙවීම මත ප්‍රතිලාභ අහිමි වී තිබුණි. | දක්වා ඇති කරුණු නැවත සිදුනොවීමට අදාළ ක්‍රියාමාර්ග ගන්නා ලෙස ඔවුන්ව දැනුවත් කරනු ලැබේ. | |
| (iv) 20 වන වගන්තිය | පනතේ 22 වන වගන්තියෙන් යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම සඳහා පැවරී ඇති බලතල ක්‍රියාත්මක කිරීම සඳහා උපදේශක කාරක සභාව රැස්විය යුතු වුවත්, 2016 නොවැම්බර් මාසයෙන් පසුව මේ දක්වාම කාරක සභාව රැස්වී නොතිබුණි. | මෙම යෝජනා ක්‍රමය ප්‍රතිව්‍යුහගත කර ස්වයං මූල්‍ය පදනමින් පවත්වාගෙන යා හැකි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයක් ආරම්භ කිරීම සඳහා ධීවර අමාත්‍යාංශය සමග සාකච්ඡා කර, අවශ්‍ය පියවර ගෙන ඇත. මේ වන විට ධීවර විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය බඳවාගැනීම නැවත ආරම්භ කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව ධීවර අමාත්‍යාංශය මගින් කමිටුවක් පත්කර ඇත. ඉදිරියේදී ලබාදෙන තීරණයන්ට අනුව කඩිනමින් උපදේශක කාරක සභාව කැඳවීමට අවශ්‍ය පියවර ගනු ලැබේ. | පනත ප්‍රකාරව උපදේශක කාරක සභාව රැස්විය යුතුය. |
| (ආ) 1992 ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| මු.රෙ. 177(1) | එකතු කර ගන්නා රජයේ මුදල් දිනපතා හෝ හැකිතාක් කලින් ප්‍රේෂණය කළ යුතු වුවද ධීවරයින්ගෙන් අයකරගනු ලබන දායක මුදල් බැංකුගත කිරීමේදී අම්පාර ධීවර දිස්ත්‍රික් කාර්යාලය විසින් දින 2 සිට දින 88 ක් දක්වා කාලයක් ගත කර තිබුණි. | එකතු කර ගන්නා වාර මුදල් කඩිනමින් එවන ලෙස ඔවුන්ට දැනුවත් කර ඇති අතර මෙම විගණන විමසුමෙන් පෙන්වා දෙන කරුණුද ඔවුන් වෙත දන්වා මුදල් ඉක්මනින් ගෙන්වා ගැනීමට අවශ්‍ය කටයුතු කරනු ලැබේ . | ධීවරයින්ගෙන් එකතු කරගන්නා මුදල් දිනපතා හෝ හැකිතාක් කඩිනමින් බැංකු ගත කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.427,806,224 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.386,869,108 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.40,937,116 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට විශ්‍රාමිකයින් සඳහා ගෙවිය යුතු විශ්‍රාම වැටුප් සඳහා සමාලෝචිත වර්ෂය වෙනුවෙන් වෙන්කරන ලද මුදල පසුගිය වසරට වඩා රු.36,824,910 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

---

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

---

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 වර්ෂය සඳහා යෝජනා ක්‍රමයට මුළු දායකය ලැබීම රු.146,707 ක් සහ ආයෝජන පොලිය රු.15,623,234 ක් වුවද මුළු විශ්‍රාම වැටුප් ගෙවීම් රු.75,337,898 ක් ද, ශුද්ධ වාරික ගෙවීම් සහ පොලිය රු.715,202 ක් හා මරණ බෙලහීන ප්‍රතිලාභ ගෙවීම් රු.288,000 ක් වූයෙන් ලැබුණු දායකය ඉක්මවා යෝජනා ක්‍රමයේ ප්‍රතිලාභ ගෙවීම් රු.60,571,159 ක් විය. අඛණ්ඩව මෙම අසතුටුදායක තත්ත්වය නිරීක්ෂණය වූ අතර 2020 වර්ෂයෙහි අනුරූපී වටිනාකම රු 68,710,450 ක් විය. යෝජනා ක්‍රමය විසින් සතුටුදායක මූල්‍ය තත්ත්වයක් ඇතිකර ගැනීම සඳහා කිසිදු සැලසුමක් ක්‍රියාත්මක කර නොතිබුණි. | මෙම ධීවර විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ ප්‍රතිලාභය දායකයාගේ වාරික වැඩිකිරීමකින් තොරව අවස්ථා කිහිපයකදී වැඩි කිරීම නිසා මෙම යෝජනා ක්‍රමය ස්වයං මූල්‍ය පදනමකින් යුතුව ක්‍රියාත්මක කිරීමට නොහැකි තත්ත්වයක් උද්ගත වී ඇත. ඉදිරියේදී ඇතිවන මුදල් අවශ්‍යතාවය මහා භාණ්ඩාගාරය සමග සාකච්ඡා කර ලබාගැනීමට කටයුතු කරනු ලැබේ. | අඛණ්ඩව පවතින අසතුටුදායක තත්ත්වය සතුටුදායක තත්ත්වයකට ගෙන ඒම සඳහා අවශ්‍ය සැලසුම් සකස්කර ක්‍රියාත්මක කළ යුතුය. |